# පරිවර්තනීය ගමනකට හරි මගක්


සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන
2010-2024



ස්විට්සර්ලන්ත රජය ශ්‍රම සංක්‍රමණ සහ එහි සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීම උදෙසා දිගුකාලීන කීර්තියක් උසුලන අතර, මෙම තීරණාත්මක ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය උදෙසා නිරතුරුව දැඩි කැපවීමකින් ක්‍රියා කරයි. මෙම කැපවීම මූර්තිමත් කරමින් 2010 වසරේදී Swiss Agency for Development and Cooperation (SDC) ආයතනය ශ්‍රී ලංකාව සඳහා සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන (SLMP) දියත් කරන ලදී. බහු පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවයෙන් සහ නව්‍ය ක්‍රමවේද අනුගමනය කිරීමෙන් මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සැලකිය යුතු ලෙස ප්‍රතිනිර්මාණය කර ඇති අතර, එමගින් ආරක්ෂිත සහ සාධාරණ පමණක් නොව සංක්‍රමණිකයන්, සේවා යෝජකයන් සහ පුළුල් ප්‍රජාව සඳහා අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් බව සහතික කරයි.

## වැඩසටහන පිළිබඳව

සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන යනු ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා නිර්මාණය වුනු පුළුල් පිවිසුමකි. එය ප්‍රධාන කොටස් කිහිපයකින් සමන්විත වේ:



## තීරණාත්මක ජයග්‍රහණ:

මෙම වැඩසටහන සැලකිය යුතු ප්‍රතිසංස්කරණවලට සහ සෘජු බලපෑම්වලට තුඩු දී ඇත:

- **ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ:** සංක්‍රමණික සේවකයන්ගේ අයිතීන් සුරැකෙන ජාතික ප්‍රතිපත්තිය සැකසීම, කලාපය තුළ පුළුල් සංක්‍රමණ ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම.

- **සදාචාරාත්මක ශ්‍රමික බඳවා ගැනීම්:** නියෝජිත ආයතන 1,000කට අධික සංඛ්‍යාවක් ශ්‍රම සූරාකෑමකින් තොර බඳවා ගැනීම් සඳහා, ආචාරධර්ම පද්ධති අනුගමනය කර ඇත.

- **ප්‍රජා ප්‍රවේශය:** මෙම වැඩසටහන මගින් සංක්‍රමණික සේවා මධ්‍යස්ථාන සහ ප්‍රජා සේවාවන් තුලින් පවුල් 250,000 කට අධික සංඛ්‍යාවකට සහයෝගය ලබාදී ඇත.

- **නිපුණතා සංවර්ධනය:** පාලනයේ සෑම තරාතිරමකම මනා සම්බන්ධීකරණ ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙසින් දහස් ගණන් සංක්‍රමණික සේවකයන් සිය සේවා නියුක්තිය ඉහළ නංවා ගෙන ඇත.

- **මග පෙන්වීම් සහ පුහුණුව: 127,000කට** අධික අනාගත සංක්‍රමණික සේවකයන්ට නීතිමය සහ මනෝ සමාජීය සහාය තුලින් මග පෙන්වීම.

- **රජයේ සංවර්ධන නිලධාරී පුහුණුව:** සංක්‍රමණික සේවකයන් සඳහා සහාය වැඩිදියුණු කරමින් විදේශ රැකියා සංවර්ධන නිලධාරීන්ගෙන් **70%ක්** පුහුණු කර ඇත.

- **COVID - 19 සහය:** ග්‍රාමීය සංක්‍රමණික සමිති තුලින් විපතට පත් පවුල් **6,000**ක් සඳහා ආධාර ලබා දී ඇත.

- **දුක්ගැනවිලි විසඳීම:** ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පවුල්වල දුක්ගැනවිලි වලින් **95%ක්** සාර්ථකව විසඳා ඇත.

- **මගපෙන්වීම සහ නිපුණතා සංවර්ධනය:** සංක්‍රමණික සේවකයින් **1,100** කට වැඩි පිරිසකට ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම සහ සහතිකපත් ලබාදීම.

- **සංක්‍රමණ තොරතුරු මධ්‍යස්ථාන:** ශ්‍රම සංක්‍රමණ පිළිබඳ විශ්වාසදායක තොරතුරු මහජනතාවට පහසුවෙන් ලබා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇත.

- **ප්‍රජා සහභාගීත්වය:** සක්‍රීය සාමාජිකයින් **3,400** කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කර ගනිමින්, සංක්‍රමණික කම්කරු සමිති **158ක්** පිහිටුවන ලදී.



# මුලපිරීම

අදියර 1 **2010-2013**

**අරමුණ:**

ශ්‍රම සංක්‍රමණය සඳහා ශක්තිමත් රාමුවක් ස්ථාපිත කිරීම.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ Helvetas සමඟ සහයෝගයෙන් මූලික ප්‍රතිපත්ති සකස් කරන ලදී.
- සංක්‍රමණ ආශ්‍රිත අභියෝගවලට මුහුණ දීම සඳහා ජාතික සහ ප්‍රජා මට්ටමේ මැදිහත්වීම් දියත් කරන ලදී.
- අනාගත ප්‍රතිසංස්කරණ සඳහා පසුබිම සකස් කරමින් සදාචාරාත්මක ශ්‍රම බඳවා ගැනීමේ සංකල්පය හඳුන්වා දෙන ලදී.



## ප්‍රවේගය ගොඩනැගීම

**අදියර 2** **2013-2016**

**අරමුණ:**

ව්‍යාප්තිය පුළුල් කිරීම සහ බඳවා ගැනීමේ පරිචයන් ශක්තිමත් කිරීම.

- බිම් මට්ටමේ සංක්‍රමණ සහාය සේවා ආරම්භ කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන සමඟ අත්වැල් බැඳගන්නා ලදි.

- 1,000කට අධික බලපත්‍රලාභී බඳවා ගැනීමේ නියෝජිතායතන අතර සදාචාරාත්මක භාවිතයන් පිළිබඳ දැනුවත් කිරීම.

- ජාතික සහ කලාපීය ප්‍රතිපත්තිවලට බලපෑම් කරමින් බඳවා ගැනීම් සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් (SOP) සකස් කර ක්‍රියාත්මක කරන ලදී.



# ප්‍රතිලාභ පුළුල් කිරීම

## අදියර 3 2016-2020

**අරමුණ:**
උපකාරක සබඳතා පුළුල් කිරීම සහ සංක්‍රමණික සේවා වැඩිදියුණු කිරීම.

- පවුල් 250,000කට අධික සංඛ්‍යාවකට ආධාර සපයමින් රට පුරා සංක්‍රමණික සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදි.

- රජය, සිවිල් සමාජ සංවිධාන (CSO) සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සම්බන්ධ කරගනිමින් බහුපාර්ශ්වික ප්‍රවේශයක් ප්‍රවර්ධනය කරන ලදී.



# ඒකාබද්ධ කිරීම සහ නවීකරණය

## අදියර 4 2021-2024

**අරමුණ:**

SLMP තුළින් ලබාගත් අවබෝධය සහ අත්දැකීම් ජාතික රාමු තුළට ඇතුළත් කර අනාගතය සඳහා නවීකරණය.

- ශ්‍රී ලංකාවේ රැකියා සඳහා සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය (2023).
- නිපුණතා විදේශ ගමන් බලපත්‍රය සහ ඊ-ආර්පීඑල් (e-RPL) වේදිකා හඳුන්වා දුන් අතර ශ්‍රමිකයින් 6,400 කට ප්‍රතිලාභ ලබාදීම.
- සංක්‍රමණික සේවකයන් සඳහා සුරක්ෂිතතාවය තහවුරු කිරීමෙහිලා හදිසි ආපදා ප්‍රතිචාර සහ ඉවත් කිරීමේ සැලැස්ම (EERP) සුහුරු පද්ධතියකට අනුගත කිරීම.
- නිපුණතා සංවර්ධනය, සාධාරණ බඳවා ගැනීමේ පරිචයන් සහ සියලු මට්ටම්වල සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කිරීම.
- දකුණු ආසියානු සුදුසුකම් නිර්ණායක රාමුව (SAQRF) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියට ඒකාබද්ධ කිරීම.

# සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 න් 13 කට SDC සහාය ලබා දී ඇත.

**ආරක්ෂිත ශ්‍රම සංක්‍රමණ පියවර පිළිබඳ දැනුවත් කිරීම්**
- පිරිමි ප්‍රතිලාභීන්: 1,454
- කාන්තා ප්‍රතිලාභීන්: 5,532
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 6,986

**අවධානය යොමුකල දුක්ගැනවිලි**
- පිරිමි ප්‍රතිලාභීන්: 101
- කාන්තා ප්‍රතිලාභීන්: 512
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 613

**විසඳුම් ලබාදුන් දුක්ගැනවිලි**
- පිරිමි ප්‍රතිලාභීන්: 36
- කාන්තා ප්‍රතිලාභීන්: 170
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 206

**සක්‍රිය සංක්‍රමණික කම්කරු සමිති**
- ක්‍රියාකාරකම්: 130
- පිරිමි ප්‍රතිලාභීන්: 20
- කාන්තා ප්‍රතිලාභීන්: 148
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 168

**සක්‍රිය ස්වයං උපකාරක කණ්ඩායම්**
- ක්‍රියාකාරකම්: 367
- පිරිමි ප්‍රතිලාභීන්: 70
- කාන්තා ප්‍රතිලාභීන්: 642
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 712

**හඳුනාගත් සහජ නායකයන්**
- පිරිමි ප්‍රතිලාභීන්: 24
- කාන්තා ප්‍රතිලාභීන්: 446
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 470

**නිපුණතා සංවර්ධන මුලපිරීම්**
- පිරිමි ප්‍රතිලාභීන්: 108
- කාන්තා ප්‍රතිලාභීන්: 369
- සම්පූර්ණ ප්‍රතිලාභීන්: 477



නව ව්‍යාපාර හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් **149 ක්** දියත් කර ඇත

සංක්‍රමණික අයිතිවාසිකම් සහ උපදේශන ව්‍යාපාර **42 ක්** පවත්වන ලදී.

සංක්‍රමණික සේවා මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය සංසද **17ක්** පිහිටුවා ඇත


Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

**Embassy of Switzerland to Sri Lanka and the Maldives**

සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණ වැඩසටහන මගින් සංක්‍රමණය සහ එහි සංවර්ධනය සඳහා ස්විට්සර්ලන්තයේ නායකත්වය සහ නව්‍ය ප්‍රවේශය ඉස්මතු කරයි. සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම, සදාචාරාත්මක භාවිතයන් සහ සංක්‍රමණික සේවකයන්ගේ යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණය සඳහා නව ප්‍රමිතියක් හඳුන්වා දී ඇත. මෙ තුලින් අප ලබා ඇති ප්‍රගතිය මත, සංක්‍රමණික සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට දීප්තිමත් අනාගතයක් සහතික කිරීම අපගේ අරමුණයි.


Schweizerische Eidgenossenschaft
Confédération suisse
Confederazione Svizzera
Confederaziun svizra

**Embassy of Switzerland to Sri Lanka and the Maldives**